සැ. යු.- (i) 2024.04.26 දින පළවූ අංක 2382 ගැසට් පත්‍රයේ III සහ (IVඅ) කොටස් පළ නොවීය.
(ii) මෙවර පළවන ගැසට් පත්‍රයේ VI කොටසේ ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයට අයත් අධිකරණ කලාපවල ජූරිසභිකයින්ගේ නාමාවලියක් සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවන්ගෙන් පළවේ.


# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,383 - 2024 මැයි මස 03 වැනි සිකුරාදා - 2024.05.03**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : (IIඅ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| තනතුරු ඇබෑර්තු .... ... ... | 1212 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 1223 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

ගැසට් පත්‍රයේ පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2024 මැයි මස 22 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2024 මැයි මස 10 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2024 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය* *www. documents.gov.*කන වෙබ් අඩවියෙන් බාගත කළ හැක.


1209 - B 82563 — 5,403 (2024/04)
B-1

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

**අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :**

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

**2. සේවා කොන්දේසි - සාමාන්‍ය** :

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකි ය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

**3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි**

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරිහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අනිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමඟම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියෙකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

**4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි**

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

**5. යුද්ධ සේවා අනුග්‍රහය**

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත භටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

**6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු**

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම**

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

**8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය**

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (II) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

## විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

"1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියලුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලු ම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකිය :-

- (i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට පෙනී සිටීම හෝ තහනම් කිරීම,
- (ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම,
- (iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
- (iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
- (v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම,
- (vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගාපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතු වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳ ව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

1. සියලු ම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාග ශාලාධිපතීන්ට ද, ඔහුගේ සහකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාග ශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමා වී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදුවේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතු ය. මොන ම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීමක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතු යි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිවිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිවිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සැලකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතු ය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතු ය. එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම් ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවල දී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත් චිත්‍ර කර්මයේ දී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපිද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවූ ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොතපතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාග ශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයෙක්ම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන, හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම, හොර උත්තර ලිවීමට යත්න දැරීමද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකු ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකාරීත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේ දී පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයෙකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත්, කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය. :—

(i) විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii) යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාග ශාලාධිපතීන්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාග ශාලාධිපතීන්හට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපිද්‍රව්‍ය (එනම් ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේ දී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක චක්‍ර සපයන ලද්දේ නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කුඩු, මකන, රෙදි කෑලි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිවිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැති වී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයෙකුට හෝ බාර නොදිය යුතුය.

(xii) යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

**විභාග කොමසාරිස් ජනරාල්.**

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

## ශ්‍රී ලංකා ස්වේච්ඡා නාවික හමුදාව

2024 වර්ෂයේ ඉඳුරාම බඳවා ගැනීම සඳහා නිලධාරී/ නිලධාරිනී පුරප්පාඩු

1. ශ්‍රී ලංකා ස්වේච්ඡා නාවික හමුදාවේ වෛද්‍ය නිලධාරීන්/නිලධාරිනියන් සඳහා පුරප්පාඩු පවතී.

2. නිර්වින්දන විශේෂඥ වෛද්‍ය (ස්වේච්ඡා) අංශය සඳහා සුදුසුකම් ඇති පිරිමි අපේක්ෂකයින්/කාන්තා අපේක්ෂිකාවන්ගෙන් ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

3. *මූලික අධ්‍යාපන සුදුසුකම්* ;

අ. අ.පො.ස. (සා/පෙළ) විභාගයේ දී අවස්ථා දෙකකට නොවැඩි වාර ගණනක දී මව් භාෂාව සහ ඉංග්‍රීසි විෂයයන්වලට සම්මාන (C) සාමාර්ථයන් සමග ගණිතය විෂය ඇතුළත්ව විෂයයන් 06ක් සමත්ව තිබීම;

*හෝ*

ආ. අ.පො.ස (සා/පෙළ) විභාගයේ දී අවස්ථා දෙකකට නොවැඩි වාර ගණනක දී මව් භාෂාව සඳහා සම්මාන (C) සාමාර්ථයක් සමග ගණිතය සහ ඉංග්‍රීසි විෂයයන් ඇතුළත්ව විෂයයන් 06ක් සමත් වී තිබීම හා ඉංග්‍රීසි විෂය සම්බන්ධව ඩිප්ලෝමාවක් හදාරා තිබීම.

4. *උසස් අධ්‍යාපනය සහ වෘත්තීය සුදුසුකම්* ;

අ. **නිර්වින්දන විශේෂඥ වෛද්‍ය (ස්වේච්ඡා නාවික හමුදාව)**

| | | |
|---|---|---|
| නිලය | - | වෛද්‍ය කොමාණ්ඩර් (පිරිමි/ කාන්තා) |
| අධ්‍යාපන සුදුසුකම් | - | විශේෂඥ වෛද්‍යවරයෙකු ලෙස ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචි වී තිබීම. |
| | - | වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය මගින් නිර්වින්දන විශේෂඥ වෛද්‍ය නිලධාරියකු වශයෙන් මණ්ඩලීය සහතිකය ලබා තිබීම. |

5. *අනෙකුත් සුදුසුකම්* :

අයදුම්කරුවන්/ අයදුම්කාරිනියන් විසින් ශ්‍රී ලංකා ස්වේච්ඡා නාවික හමුදාවට බැඳීමට පහත සඳහන් පොදු කොන්දේසි අනිවාර්යෙන් ම සපුරාලිය යුතුය ;

| | | | |
|---|---|---|---|
| අ. | පුරවැසිභාවය | - | ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුයි. |
| ආ. | වයස | - | අවුරුදු 48ට අඩු විය යුතුය. |
| ඇ. | උස | - | පිරිමි - අඟල් 66 ට නොඅඩු විය යුතුය.<br>කාන්තා - අඟල් 63 ට නොඅඩු විය යුතුය. |
| ඈ. | බර | - | පිරිමි - කි.ග්‍රෑ. 52 ට නොඅඩු විය යුතුය.<br>කාන්තා - කි.ග්‍රෑ. 41 ට නොඅඩු විය යුතුය. |
| ඉ. | පපුව (පිරිමි) | - | අඟල් 32ට නොඅඩු විය යුතුය. |
| ඊ. | වර්ණ දෘෂ්ටිය | - | එස්ටීඩී II (නිසි පෙනුම). |
| උ. | දෘෂ්ටි තීක්ෂණත්වය | - | වම් ඇස 6/6 සහ දකුණු ඇස 6/6 (උපැස්/ අක්ෂි කාච රහිතව)<br>[වෛද්‍ය අංශය සඳහා 6/12 දෘෂ්ටි තීක්ෂණත්වය උපැස් මගින් 6/6 දක්වා නිවැරදි කර ඇති පුද්ගලයන් සලකා බැලිය හැක.] |
| ඌ. | සිවිල් තත්වය | - | විවාහක/අවිවාහක. |

6. ක්‍රීඩා ක්ෂේත්‍රයේ ලබාගත් විශිෂ්ට දක්ෂතා ගැන නිසිලෙස සලකා බලනු ලැබේ. තව ද, දැනටමත් රජයේ සහ පෞද්ගලික අංශයේ රැකියාවක නියුතු අයදුම්කරුවන්/ අයදුම්කාරිනියන් සඳහා විශේෂ ප්‍රමුඛතාවයක් ලබාදෙනු ලැබේ.

7. ඉහත සඳහන් 3, 4 සහ 5 ඡේදයන් හි දක්වා ඇති අවශ්‍යතාවයන් සපුරා නොමැති අයදුම්කරුවන්ගේ/ අයදුම්කාරිනියන්ගේ ඉල්ලුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

8. *සේවා කොන්දේසි ;*

අ. අපේක්ෂකයින්/අපේක්ෂිකාවන් ස්වේච්ඡා නාවික හමුදාවේ නිලධාරි/නිලධාරිනී තනතුරු සඳහා බඳවාගනු ලබන අතර, ඔවුන් මූලික පුහුණුවීමේ පාඨමාලාවන් හැදෑරිය යුතුවේ.

ආ. ශ්‍රී ලංකා නාවික හමුදාධිපති විසින් තීරණය කරනු ලබන පරිදි ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක හෝ විදේශයක පුහුණුව ලැබීම සඳහා බඳවාගනු ලබන නිලධාරීන්/නිලධාරිනියන් සූදානමින් සිටිය යුතුයි.

ඇ. සියලුම නිලධාරීන්/නිලධාරිනියන් රාජකාරි හෝ පුහුණුවීම සඳහා ඕනෑම අවස්ථාවක දී ලෝකයේ ඕනෑම රටකට අනුයුක්ත කරනු ලැබීමට යටත් විය යුතුය.

ඈ. පුහුණුව ලබන කාලසීමාව තුළ දී හා ඉන්පසුව නිලධාරීන්/නිලධාරිනියන් ශ්‍රී ලංකා නාවික හමුදා පනත, නාවික හමුදා නියෝග සහ සංදේශ මගින් බලාත්මක කරනු ලබන නීති රීති හා උපදෙස් වලටත් මින්මතුවට පනවනු ලබන නීති රීති හා උපදෙස් වලටත් යටත් විය යුතුයි.

ඉ. පුහුණුව ලබන කාලසීමාව තුළ ඕනෑම අවස්ථාවක දී යම්කිසි නිලධාරියෙකුගේ/ නිලධාරිනියකගේ නොමනා හැසිරීම මත හෝ ඔහු/ඇය විසින් වගකිව යුතු කිසියම් හේතුවක් මත හෝ ඔහු/ඇය අධිකාරියක් පිරිනැමීමට යෝග්‍ය නොවේ යැයි වගකිව යුත්තන් විසින් තීරණය කරන ලද්දේ නම් එම අවස්ථාවේදී ම අදාළ නිලධාරියා/නිලධාරිනිය විසින් එතෙක් ඔහු/ ඇය වෙනුවෙන් දරා ඇති සියලුම වියදම් ශ්‍රී ලංකා ජනරජයට ආපසු ගෙවීමට එකඟවන බවට ශ්‍රී ලංකා ජනරජයේ නියෝජිතයා වශයෙන් ශ්‍රී ලංකා නාවික හමුදාධිපති සමග ගිවිසුමකට හා බැඳුම්කරයකට ඇතුළත් විය යුතුයි.

ඊ. අධිකාරිය සඳහා පුහුණුවන කාලසීමාව තුළ දී යම් නිලධාරියෙකු/නිලධාරිනියක හට තම අපේක්ෂකත්වය සිය කැමැත්තෙන් අත්හිටුවා ගැනීමට අවශ්‍ය වුවහොත් ශ්‍රී ලංකා ජනරජය මගින් එම නිලධාරියා/නිලධාරිනිය වෙනුවෙන් එතෙක් දරා ඇති සියලුම වියදම් එම නිලධාරියා/නිලධාරිනිය විසින් ශ්‍රී ලංකා ජනරජයට ආපසු ගෙවිය යුතු වේ.

9. *රාජ්‍ය භාෂා පිළිබඳ අවශ්‍යතා;*

තෝරාගනු ලබන අපේක්ෂකයින්/අපේක්ෂිකාවන් 1956 අංක 33 දරන රාජ්‍ය භාෂා පනතේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම පිණිස දැනට පනවා ඇති හා මින් ඉදිරියට පනවනු ලබන නියෝග හා ව්‍යවස්ථාවන් පිළිපැදිය යුතුවේ.

10. *වැටුප් හා දීමනා;*

2020.01.01 දින සිට ගෙවීම් කරනු ලබන්නේ කළමනාකරණ සේවා චක්‍රලේඛ 03/2016 අනුව වේ.

| *විස්තරය* | *ශ්‍රේණිය* | *කොමාණ්ඩර් (රු.)* | *කපිතාන් (රු.)* | *කොමදෝරු (රු.)* |
|---|---|---|---|---|
| මූලික වැටුප | විශේෂ ශ්‍රේණිය | 88,000.00 | 88,000.00 | 88,000.00 |
| ජීවන වියදම් දීමනාව | - | 17,800.00 | 17,800.00 | 17,800.00 |
| නිළ ඇඳුම් දීමනාව | - | 525.00 | 525.00 | 525.00 |
| අතුරු දීමනාව | - | 1,000.00 | 1,000.00 | 1,000.00 |
| විශේෂ අමතර දීමනාව | - | 3,000.00 | 3,000.00 | 3,000.00 |
| අතුරු දීමනාව - 2022 | - | 5,000.00 | 5,000.00 | 5,000.00 |
| බාධා පැමිණ සිටීමේ හා ප්‍රවාහන දීමනාව | විශේෂ ශ්‍රේණිය | 70,000.00 | 70,000.00 | 70,000.00 |

| විස්තරය | ශ්‍රේණිය | කොමාණ්ඩර් (රු.) | කපිතාන් (රු.) | කොමදෝරු (රු.) |
|---|---|---|---|---|
| විශ්‍රාම වැටුප් සහිත දීමනාව | විශේෂ ශ්‍රේණිය | 3,400.00 | 3,400.00 | 3,400.00 |
| විශ්‍රාම වැටුප් රහිත දීමනාව | ප්‍රාථමික ශ්‍රේණිය | 2,125.00 | 2,125.00 | 2,125.00 |
| විශේෂ අමතර දීමනාව (වෛද්‍ය නිලධාරී | විශේෂ ශ්‍රේණිය | 1,500.00 | 1,500.00 | 1,500.00 |
| පරිපාලන ශ්‍රේණිය | පරිපාලන ශ්‍රේණිය | 6,000.00 | 6,000.00 | 6,000.00 |
| | එකතුව | 198,350.00 | 198,350.00 | 198,350.00 |

11. පුහුණුව ලබන කාල සීමාවේ දී හා ඉන් පසුව හිමි වන පහසුකම්, දීමනා සහ වරප්‍රසාද :

අ. පුහුණුව ලබන කාලසීමාව තුළ නිලධාරීන්/ නිලධාරිනියන් හට නිලධාරී නිවාස තුලින් නේවාසික පහසුකම් සහ ආහාර සපයනු ලැබේ.

ආ. නොමිලේ දුම්රියේ ගමන් කළ හැකි නිවාඩු දුම්රිය බලපත්‍ර කට්ටල තුනක් වසරකට (අදාළ පරිදි නිලධාරියාට/නිලධාරිනියට, කාලත්‍රයාට, දරුවන්ට සහ යැපෙන්නන්ට) හිමිවනු ලැබේ.

ඇ. කඳවුර තුළ වාසය කරන නිලධාරීන්ට/නිලධාරිනියන්ට මසකට වරක් නිලධාරී නිවස්නයේ සිට තම නිවසට යාමට සහ ඒමට රාජකාරී නිවාඩු දුම්රිය ගමන් බලපත්‍ර කට්ටලයක් හෝ බස් ගාස්තු ගෙවනු ලැබේ.

ඈ. නිළ ඇඳුම් සහ ඊට අදාළ අනෙකුත් භාණ්ඩ නොමිලයේ සපයනු ලැබේ.

ඉ. නොමිලයේ වෛද්‍ය පහසුකම් සපයනු ලැබේ (අදාළ පරිදි නිලධාරියාට/නිලධාරිනියට කාලත්‍රයාට, දරුවන්ට සහ යැපෙන්නන්ට).

ඊ. රජයේ නිවාසයක වාසය නොකරන විවාහක නිලධාරීන්ට/නිලධාරිනියන්ට රු.3,200.00 සිට රු. 8,500.00 දක්වා ගෙවල් කුලී දීමනාවක් හිමි වේ.

උ. ආහාර දීමනාව ආහාරයෙන් බැහැර නිලධාරීන්/නිලධාරිනියන් සඳහා පමණක් හිමි වේ.

ඌ. සුදුසුකම් වැටුප අදාළ පරිදි මසකට උපරිම රු. 637.50 ක් ගෙවනු ලැබේ.

එ. විවාහක නිලධාරීන්/නිලධාරිනියන් සඳහා විවාහක නිවස්නයන්හි පවතින පුරප්පාඩු මත නිවාස සැපයේ. මේ සඳහා ගෙවල් කුලිය රාජ්‍ය සේවකයින්ට අදාළ පරිදි අය කරනු ලැබේ.

12. අයදුම්කරුවන්ට/ අයදුම්කාරිනියන්ට උපදෙස් :

අ. පහතින් දක්වා ඇති ආකෘතියට අනුව ඉල්ලුම්පතෙහි සියලුම ඡේදයන් හැකි පමණ විස්තර සහිතව පැහැදිලි අත් අකුරින් සම්පූර්ණ කළ යුතුයි. ඉල්ලුම්පත් **2024 මැයි මස 25 වන දින දහවල් 1200** ට ප්‍රථම ලැබෙන සේ 'ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරී (බඳවා ගැනීම්), ශ්‍රී ලංකා නාවික හමුදා මූලස්ථානය, තැ. පෙ. 593, කොළඹ 01 යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය. ලියාපදිංචි තැපැලෙන් නොලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ. ඉල්ලුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ 'ඉදුරාම බඳවා ගැනීම 2024/01 - ස්වේච්ඡා නිලධාරීන්/නිලධාරිනියන්' යනුවෙන් සටහන් කළ යුතුයි. තවද, ලියාපදිංචි තැපැලෙන් ඉදිරිපත් කරනු ලබන අයදුම්පත් මාර්ගගත ක්‍රමයට ද අයදුම් කලයුතු අතර මෙම දෙයාකාරයෙන් ම ඉදිරිපත් නොකරන අයදුම්පත් සහ ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ. මේ පිළිබඳ වැඩිදුර විස්තර www.navy.lk වෙබ් අඩවියට පිවිසීමෙන් ලබාගත හැකි අතර, වැඩි විස්තර දුරකතන අංක 011-7195120/ 011-7195154 මගින් ලබාගත හැක.

ආ. ප්‍රතික්ෂේපිත අයදුම්පත් පිළිබඳව දැනුම් දීමක් සිදු කරනු නොලැබේ. තැපෑලේ දී යම් අයදුම්පත්‍රයක් නැතිවූ බවට හෝ ප්‍රමාද වූ බවට වන කිසිදු පැමිණිල්ලක් සලකා බලනු නොලැබේ. අයදුම්පත් ලද බවට දැනුම් දීමක් සිදු කරනු නොලැබේ.

ඇ. රාජ්‍ය සේවයේ (දෙපාර්තමේන්තු/සංස්ථා/මණ්ඩල/සිවිල් ආයතනයන්හි) නියුතු අයදුම්කරුවන්ගේ/ අයදුම්කාරිනියන්ගේ ඉල්ලුම්පත්, අපේක්ෂකයා තෝරා ගතහොත් නිදහස් කළ හැකි බවට සහතිකයක් ද සහිතව ආයතන ප්‍රධානියා (දෙපාර්තමේන්තුවේ/ සංස්ථාවේ/ මණ්ඩලයේ/ සිවිල් ආයතනයේ) මගින් ඉදිරිපත් කළ යුතුය.

ඈ. සම්මුඛ පරීක්ෂණයන්ට හෝ වෙනයම් අවස්ථාවක කැඳවනු ලැබූ විට අපේක්ෂකයින්/ අපේක්ෂිකාවන් පහත සඳහන් ලියකියවිලිවල මුල් පිටපත් ඉදිරිපත් කළ යුතු අතර, ඉල්ලුම්පත් යොමු කිරීමේ දී මෙම ලියකියවිලිවල සහතික කරන ලද ඡායා පිටපත් අමුණා එවිය යුතුය. ‍:

(1) උප්පැන්න සහතිකය,
(2) අයදුම්කර ඇති අංශයට අදාළ අධ්‍යාපන සුදුසුකම් ඇති බව සනාථ කිරීමට අධ්‍යාපන/උසස් අධ්‍යාපන/වෘත්තීය අධ්‍යාපන/උපාධි/පස්චාත් උපාධි සහතික,
(3) පාසල් හැරයාමේ සහතිකය සහ පාසලෙන් ලබාගත් චරිත සහතිකය,
(4) මාස 06ක් ඇතුළත ලබාගත් ග්‍රාම නිලධාරි සහතිකය,
(5) පිළිගත් ආයතනයකින් ලබාගත් වෘත්තීය පළපුරුද්දක් ඇත්නම් ඒ පිළිබඳ සහතික.
(6) මෑතක දී ලබාගත් චරිත සහතික දෙකක් (අවුරුදු දෙකකට වැඩි කාලයක් අයදුම්කරු ගැන දැන සිටින වගකිව යුතු පුද්ගලයෙකුගෙන් හෝ දැනට සේවා යෝජකයාගෙන් විය යුතුය),
(7) ක්‍රීඩා හා වෙනත් සුදුසුකම් පිළිබඳ සහතික.

ඉ. නියමකරන ලද අවස්ථාවන්හි දී මෙම ලියකියවිලි ඉදිරිපත් කිරීමට නොහැකි අපේක්ෂකයින්/ අපේක්ෂිකාවන්ගේ ඉල්ලුම්පත් ගැන සලකා බලනු නොලැබේ.

ඊ. වෙනත් ලියකියවිලි හෝ ලේඛනවල මුල් පිටපත් කිසිවක් අයදුම්පත් සමඟ නොඑවිය යුතුය. එසේ සිය අයදුම්පත සමග සහතිකවල මුල් පිටපත් එවා එම සහතික අස්ථානගත වුවහොත් නාවික හමුදාව ඊට වගකියනු නොලැබේ.

13. ඉල්ලුම්පතෙ හි අසත්‍ය ප්‍රකාශයන් කර තිබී, එම අසත්‍යතාවය අපේක්ෂකයා/ අපේක්ෂිකාව තෝරා ගැනීමට ප්‍රථම හෙළිදරව් වුවහොත් ඔහුගේ/ ඇයගේ අපේක්ෂකත්වය අහිමි කිරීමට ද, තෝරා ගැනීමෙන් පසු හෙළිදරව් වුවහොත් ඔහු/ ඇය දඬුවම් සහිතව සේවයෙන් පහ කිරීමට ද යටත් වේ.

14. බඳවා ගැනීමේ ක්‍රියාපටිපාටිය :

අ. ඉහත අවශ්‍යතාවයන් සපුරාලන අපේක්ෂකයින්/අපේක්ෂිකාවන් පළමු සම්මුඛ පරීක්ෂණයට පැමිණි විට උස, වයස, ඇස් පෙනීම හා බර පරීක්ෂා කිරීම සඳහා මූලික වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත් කරනු ලැබේ. *ගැසට් පත්‍රයේ* දක්වා ඇති පරිදි උස, වයස, ඇස් පෙනීම හා බර නොමැති අයදුම්කරුවන්/අයදුම්කාරිනියන් සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් කරනු නොලැබේ. යම් අයදුම්කරුවෙකුගේ/අයදුම්කාරිනියකගේ උස සහ වයස නියමිත පරිදි නොමැති වුවද නාවික හමුදා සේවයට ප්‍රයෝජනවත් වන විශේෂ නිපුණතාවයක් ඔහුට/ඇයට ඇත්නම් සේවා අවශ්‍යතාවය මත නාවික හමුදාධිපතිගේ අනුමැතිය පරිදි ඔහු/ඇය ගැන සලකා බලනු ලැබේ. මූලික සම්මුඛ පරීක්ෂණයෙන් සමත්වන අයදුම්කරුවන්/අයදුම්කාරිනියන් පමණක් පහත සඳහන් ශාරීරික යෝග්‍යතා පරීක්ෂණය සඳහා ඉදිරිපත් කරනු ලබයි.

ආ. ශාරීරික යෝග්‍යතා පරීක්ෂණය සමත් වීම සඳහා අවශ්‍යතා :

| *ස්ත්‍රී පුරුෂ භාවය* | *PUSH UPS (මිනිත්තු 1ක් තුළ)* | *CURL UPS (මිනිත්තු 1ක් තුළ)* | *මීටර 1600 දුර දිවීම (මිනිත්තු)* |
|---|---|---|---|
| පුරුෂ | 12 | 12 | 09 |
| ස්ත්‍රී | 08 | 07 | 11 |

ඇ. ශාරීරික යෝග්‍යතා පරීක්ෂණයෙන් සමත්වන අයදුම්කරුවන්/ අයදුම්කාරිනියන් පමණක් නාවික හමුදා රෝහල මගින් සිදුකරන සම්පූර්ණ වෛද්‍ය පරීක්ෂණය සඳහා යොමු කරන අතර, වෛද්‍ය පරීක්ෂණය සමත් අයදුම්කරුවන්/ අයදුම් කාරිණියන් දෙවන සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබයි. දෙවන සම්මුඛ පරීක්ෂණය සමත්වන අයදුම්

කරුවන් අයදුම්කාරිනියන් අවසන් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවීම් කරනු ලබයි. එම පරීක්ෂණයේ දී ලබා ගන්නා ලද ලකුණු සහ පවත්නා ඇබෑර්තු සංඛ්‍යාව මත වැඩිම ලකුණු ලබාගත් අයදුම්කරුවන්/ අයදුම්කාරිනියන් පමණක් බඳවාගනු ලැබේ.

ඇ. බඳවා ගැනීම සඳහා සුදුසුකම් නොලබන අයදුම්කරුවන්ට/ අයදුම්කාරිනියන්ට ඒ බව දන්වා සිටිනු නොලැබේ.

ඉ. සම්මුඛ පරීක්ෂණය සඳහා තෝරාගනු ලබන අයදුම්කරුවන්/ අයදුම්කාරිනියන් හට සම්මුඛ පරීක්ෂණ පවත්වන දිනය, වේලාව සහ ස්ථානය Whatsapp පණිවිඩයක් මගින් පමණක් දැනුම් දෙන අතර කිසිදු පණිවිඩයක් ලිඛිතව තැපැල් මගින් දැනුම් දෙනු නොලැබේ. සම්මුඛ පරීක්ෂණවලට සහභාගී වීම සම්බන්ධයෙන් ගමන් වියදම් හෝ වෙනත් කිසිදු වියදමක් ගෙවනු නොලැබේ.

ඊ. මෙම තනතුර සම්බන්ධයෙන් අයදුම්කරුවෙකු/ අයදුම්කාරිනියක කැඳවනු ලබන සෑම අවස්ථාවකදීම පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත ඔහු/ ඇය විසින් ඉදිරිපත් කළ යුතුය.

උ. අයදුම්කරුවකු/ අයදුම්කාරිනියක නිර්දේශ කිරීමට අදහස් කරන කවරෙකු විසින් වුවද, එසේ කළ යුත්තේ ඔහුට/ ඇයට සහතිකයක් දීමෙනි. අයදුම්කරුවකු/ අයදුම්කාරිනියක තෝරා ගැනීම සඳහා කවාකාරයෙන් හෝ පෙළඹවීම් නැතහොත් බලපෑම් කිරීමට උත්සාහ කිරීම, එම අයදුම්කරු/ අයදුම්කාරිනිය නුසුදුසු අයෙක් වීමට හේතුවන්නේය.

ඌ. අයදුම්කරුවන්/ අයදුම්කාරිනියන් විසින් ඉදිරිපත් කරනු ලබන අධ්‍යාපන සහ වෘත්තීය සුදුසුකම් පිළිබඳ සහතික විභාග දෙපාර්තමේන්තුව සහ අදාළ ආයතන සමග සම්බන්ධීකරණය වී ඒවායේ සත්‍යතාවය සහතික කරගනු ලබයි.

එ. සියලුම අයදුම්කරුවන්ගේ/ අයදුම්කාරිනියන්ගේ ආරක්ෂක නිශ්කාෂණ වාර්තා ශ්‍රී ලංකා නාවික හමුදා මූලස්ථානය මගින් නැවත පරීක්ෂාවට යොමු කරනු ලැබේ.

15. ශ්‍රී ලංකා නාවික හමුදාවට ඉඳුරාම නිලධාරීන්/නිලධාරිනියන් බඳවා ගැනීමේ ක්‍රියාවලිය පිළිබඳ අවසන් තීරණ ගැනීමේ බලතල ශ්‍රී ලංකා නාවික හමුදාධිපති සතු වන අතර, ජාතික ආරක්ෂාව, ශ්‍රී ලංකා නාවික හමුදාවේ සංග්‍රාමික සහ පරිපාලනමය අවශ්‍යතාවයන් අනුව ඉහත අවශ්‍යතාවයන් සහ කොන්දේසිවල වෙනස්කම් සිදු කිරීමේ අවසාන තීරණය නාවික හමුදාධිපති සතුවේ.

*සටහන* - මෙම *ගැසට්* නිවේදනය සිංහල, ඉංග්‍රීසි සහ දෙමළ යන භාෂා ත්‍රිත්වයෙන්ම පළවේ. දෙමළ සහ ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතුය.

යූවීඑම්පී පෙරේරා, ආර්එස්පී**, යූඑස්පී, එන්ඩීයූ, පීඑස්සී
වයිස් අද්මිරාල්
ශ්‍රී ලංකා නාවික හමුදාධිපති.

ශ්‍රී ලංකා නාවික හමුදා මූලස්ථානය,
තැ. පෙ. 593,
කොළඹ 01.

**ශ්‍රී ලංකා ස්වේච්ඡා නාවික හමුදාවට ඉඳුරාම බඳවා ගන්නා නිලධාරීන්/නිලධාරිනියන් සඳහා ඉල්ලුම්පත**

1. පුරවැසිභාවය :————.
(ශ්‍රී ලංකා පුරවැසියෙකු වන්නේ පෙළපතින් ද ලියාපදිංචි වීමෙන් ද යන්න සඳහන් කරන්න. ලියාපදිංචි කිරීමෙන් නම් එම සහතික පත්‍රයේ දිනය සහ අංකය සඳහන් කරන්න)

2. ඉල්ලුම් කරන තනතුර :————.

3. සම්පූර්ණ නම (ජාතික හැඳුනුම්පතට අනුව) :————.

4. ජාතික හැඳුනුම්පත් අංකය :————.

5. ස්ථිර ලිපිනය :————.

6. තැපැල් ලිපිනය :————.

7. විද්‍යුත් ලිපිනය :————.

8. උපන් දිනය :————.

9. වයස ඃ අවුරුදු :————. මාස :————. දින :————. (2024...... මස ..... වන දිනට )

10. උස :————. (අඟල්) පපුව :————. (අඟල් - පිරිමි පමණි) බර :————. (කි.ග්‍රෑ.)

11. ස්ථිර ලිපිනයට අයත් පොලිස් ස්ථානය :————.

12. දිස්ත්‍රික්කය :————.

13. ඡන්ද කොට්ඨාසය :————.

14. ග්‍රාම නිළධාරී කොට්ඨාසය :————.

15. දුරකථන (Whatsapp) අංකයඃ :————.

16. විවාහක/ අවිවාහක බව :————.

17. ස්ත්‍රී/ පුරුෂ භාවය :————.

18. අධ්‍යාපනය ලැබූ පාසල් :————.

19. පාසල සහ විශ්වවිද්‍යාල පිළිබඳ විස්තර ඃ

| පාසලේ/ විශ්වවිද්‍යාලයේ නම | සමත් විභාගය | විභාගයට පෙනී සිටි වර්ෂය | සමත් වූ විෂයයන් (ශ්‍රේණි ඇතුලුව) |
|---|---|---|---|
| | අ.පො.ස (සා.පෙළ)<br>අ.පො.ස (උ.පෙළ)<br>වෙනත් | | |

20. පාසලෙන්/ විශ්වවිද්‍යාලයෙන් ඉවත් වූ පසු කළ රැකියා පිළිබඳ විස්තර ඃ

| සේවා යෝජකයාගේ නම සහ ලිපිනය | රැකියාවේ ස්වභාවය | සේවා කාලය | |
|---|---|---|---|
| | | සිට | දක්වා |
| | | | |
| | | | |

21. දෙමව්පියන් පිළිබඳ විස්තර ඃ

| සම්පූර්ණ නම | උපන් ස්ථානය | රැකියාව | වර්තමාන ලිපිනය |
|---|---|---|---|
| පියා | | | |
| මව | | | |

22. තනතුර සඳහා ඇති විශේෂ සුදුසුකම් :...........................................................................
.................................................................................................................

23. ක්‍රීඩා අතින් දැනට පවත්නා විශිෂ්ටතා පිළිබඳ විස්තර (ඔබ සහභාගී වූ තරග සහ ක්‍රීඩා කණ්ඩායම්, දිනයන් හා ලැබූ විශිෂ්ටතා දක්වන්න) : .................................................................................................
.................................................................................................................
......

24. පාසලේ/ විශ්වවිද්‍යාලයේ/ බාහිර සංවිධානවල දී දක්වා ඇති වෙනත් විශිෂ්ටතා (දිනයන් සමග විස්තර දක්වන්න) : .........
.................................................................................................................
.................................................................................................................

25. සන්නද්ධ සේවා/ ස්වේච්ඡා බළ සේනාවේ/ ශිෂ්‍යභට බළකායේ හෝ බාලදක්ෂ ව්‍යාපාරයේ ඇති සේවය : .................
.................................................................................................................

26. ශ්‍රී ලංකා නාවික හමුදාවට හෝ සන්නද්ධ හමුදා කිසිවකට හෝ පොලීසියට හෝ බැඳීම සඳහා ඔබ විසින් මීට පෙර ඉල්ලීම් කර තිබේද ? එසේනම් ඒ පිළිබඳ විස්තර සහ ඒ ඉල්ලීම්වලට සිදුවූයේ කුමක්දැයි සඳහන් කරන්න :........................
.................................................................................................................
.................................................................................................................

27. සිවිල් හෝ යුධ අධිකරණයක දී ඔබ වැරදිකරු කර හෝ අත්හිටවූ සිර දඬුවමක් ලබා තිබේද ? එසේනම් විස්තර සඳහන් කරන්න : ...............................................................................................................
.................................................................................................................

28. රාජ්‍ය අංශයෙහි දෙපාර්තමේන්තුවක/ මණ්ඩලයක/සංස්ථාවක (මහ බැංකුව, රාජ්‍ය බැංකු, විශ්වවිද්‍යාල, රජය විසින් පාලනය කරන සිවිල් ව්‍යාපාර/ සමාගම් ආදිය ඇතුළුව) සේවයෙහි යෙදී සිටියේ නම් එහි සේවය අවසන් කිරීමට හේතු :
.................................................................................................................
.................................................................................................................
.................................................................................................................

29. චරිත සහතික පිළිබඳ විස්තර

| නම | පදවිය | තැපැල් ලිපිනය |
|---|---|---|
| | | |

30. අයදුම්කරු/ අයදුම්කාරිනිය විසින් අත්සන් කළ යුතු ප්‍රකාශය.

පූර්වෝක්ත ප්‍රකාශවලට මා විසින් දී ඇති පිළිතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි බව අවංකව ප්‍රකාශ කරමි. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළවූ ශ්‍රී ලංකා නාවික හමුදාවේ අධිකාරිය සඳහා තෝරාගනු ලබන අපේක්ෂකයන්/ අපේක්ෂිකාවන් සම්බන්ධයෙන් අනුගමනය කරන ක්‍රියාපිළිවෙල හා අදාළ වන රෙගුලාසි ද මම කියවා අවබෝධ කර ගතිමි.

________,
අයදුම්කරුගේ/අයදුම්කාරිනියගේ අත්සන.

දිනය :________.

05-44

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

සංශෝධනයයි

**සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය**

ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව

**ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ ආධුනික මිනින්දෝරු තනතුරුවලට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2024**

අංක 2372 දරන 2024 පෙබරවාරි මස 16 වැනි දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළ කරන ලද ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ ආධුනික මිනින්දෝරු තනතුරුවලට බඳවා ගැනීම සඳහා වන විවෘත තරග විභාගය - 2024 විභාග නිවේදනයේ 5(vi) හා 08 ඡේදයන්හි අයදුම්පත් කැඳවන අවසන් දිනය, **2024.05.17** දින ලෙස මෙයින් සංශෝධනය වේ. එමෙන් ම අනෙකුත් සංශෝධන පහත පරිදි වේ.

ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ ආධුනික මිනින්දෝරු තනතුරුවලට බඳවා ගැනීම සඳහා වන විවෘත තරඟ විභාගය, විභාග කොමසාරිස් ජනරාල් විසින් 2024 ජූලි මාසයේ දී කොළඹ දී පවත්වනු ලැබේ. විභාගය පවත්වන දිනය හා ස්ථානය යථා කාලයේදී දන්වනු ලැබේ.

ශ්‍රී ලංකා මිනින්දෝරු සේවයේ III ශ්‍රේණියේ පවතින පුරප්පාඩු පිරවීමට හැකිවන සේ ශ්‍රී ලංකා මිනින්දෝරු සේවයෙන් පරිබාහිරව මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ ආධුනික මිනින්දෝරු තනතුරු **97ක්** සඳහා බඳවා ගැනීමට පහත පරිදි නියමිත සුදුසුකම් සම්පූර්ණ කළ අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. (පුරප්පාඩු සියල්ලම හෝ කිසියම් ගණනක් නොපිරවීමට පත්වීම් බලධාරියාට බලය ඇත.)

| | | |
|---|---|---|
| 01 | මැනුම් විද්‍යා උපාධිධාරීන් | තනතුරු 87 |
| 02 | අනෙකුත් උපාධිධාරීන් | තනතුරු 10 |

තව ද අංක 2372 දරන 2024 පෙබරවාරි මස 16 වන දිනැති ඉහත *ගැසට්* පත්‍රයේ 1.5 හි සඳහන් වයස සීමාව පහත පරිදි සංශෝධනය වේ.

1.5.1 අවම වයස් සීමාව අවුරුදු 22,
1.5.2 උපරිම වයස් සීමාව අවුරුදු 35,

''ඒ අනුව **2002.02.16** දිනට හෝ එදිනට පෙර හා **1989.02.16** දිනට හෝ ඊට පසු උපන් දිනය යෙදී ඇති අයට පමණක් මේ සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ඇත.'' (එනම් **1989.02.16** සිට **2002.02.16** යන දින දෙක ද ඇතුළුව ඒ අතර කාලය තුල උපන් දිනය සඳහන් අයට මේ සඳහා අයදුම් කළ හැක.)

**සටහන :**

අංක 2372 දරන 2024 පෙබරවාරි මස 16 වන දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට්* පත්‍රයේ පළ කරන ලද ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ ආධුනික මිනින්දෝරු තනතුරුවලට බඳවාගැනීම සඳහා වන විවෘත තරග විභාගය - 2024 සඳහා දැනටමත් අයදුම් කර ඇති වයස අවුරුදු 28ට වැඩි හා වයස අවුරුදු 35ට අඩු අයදුම්කරුවන් නැවත අයදුම් කිරීම අවශ්‍ය නොවේ.

ඩබ්ලිව්. සුදත් එල්. සී. පෙරේරා,
සර්වේයර් ජනරාල්.

2024 මැයි මස 03 වැනි දින,
මිනින්දෝරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

05-22

සංශෝධනයයි

**ඉංජිනේරු තාක්ෂණ ආයතනය**

ඉංජිනේරු විද්‍යා ජාතික ඩිප්ලෝමා පාඨමාලාව සඳහා සිසුන් ඇතුළත් කර ගැනීම - 2024 කණ්ඩායම

2024.03.15 දින ගැසට් අංක 2376 ඔස්සේ පළ කරන ලද කටුනායක, ඉංජිනේරු තාක්ෂණ ආයතනයේ ''ඉංජිනේරු විද්‍යා ජාතික ඩිප්ලෝමා'' පාඨමාලාව සඳහා 2024 වසරට ආධුනිකයින් බඳවා ගැනීම සඳහා වූ අයදුම්පත් භාර ගැනීම **2024.05.16** දින දක්වා දීර්ඝ කිරීමට එම ඉංජිනේරු තාක්ෂණ ආයතනයේ අධ්‍යයන පාලක මණ්ඩලය තීරණයකොට ඇත.

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මාර්ගගත ක්‍රමය ඔස්සේ අයදුම්පත් භාර ගැනීම **2024.05.16 දින රාත්‍රී 12.00ට** අවසන්වන අතර ඉංජිනේරු තාක්ෂණ ආයතනය ලියාපදිංචි තැපෑලෙන් අයදුම්පත් භාර ගැනීම **2024.05.30** න් අවසන් වේ.

05-64

---

**බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව**

බෞද්ධ ධර්මාචාර්ය විභාගය - 2024

ව්‍යවස්ථාව හා නිර්දේශ පත්‍රය

2020, 2021,2022,2023 වසරවලට නියමිත බෞද්ධ ධර්මාචාර්ය විභාගය සඳහා විභාග කොමසාරිස් ජනරාල් විසින් අයදුම්පත් කැඳවනු ලැබේ.

**02.** විභාග මධ්‍යස්ථාන :- උපලේඛන 01 හි දක්වා ඇති සෑම දිස්ත්‍රික්කයකම අයදුම්කරුවන්ගේ සංඛ්‍යාව අනුව විභාග මධ්‍යස්ථාන පිහිටවනු ඇත. එහෙත් යම් නගරයක් සඳහා ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් ඉදිරිපත් නොවන අවස්ථාවලදී එකී නගරයේ විභාග මධ්‍යස්ථාන අවලංගු කොට අදාළ අයදුම්කරුවන් ඊට ආසන්නව පිහිටි වෙනත් විභාග මධ්‍යස්ථානයක් වෙත යොමු කිරීමට සිදුවනු ඇත.

03. *භාෂා මාධ්‍යය* :- මෙම විභාගය සිංහල හා ඉංග්‍රීසි යන භාෂා මාධ්‍යවලින් පමණක් පවත්වනු ලැබේ. එහෙත් යම් අයදුම්කරුවෙකුට විභාගයට පෙනී සිටීමට ඉඩදෙනු ලබන්නේ තමන් කැමති එක් භාෂා මාධ්‍යයකින් පමණි.

04. *සුදුසුකම්* :- මෙම විභාගය සඳහා අයදුම් කරන සෑම අයදුම්කරුවෙකුම පහත දක්වා ඇති සුදුසුකම් අතුරින් යටත් පිරිසෙයින් කවර හෝ එක් සුදුසුකමක් සපුරා තිබිය යුතුය.

4.1 දහම් පාසල් අවසාන සහතික පත්‍ර විභාගය සමත් වී තිබීම

හෝ

4.2 ප්‍රාචීන ප්‍රාරම්භ විභාගය සමත් වී තිබීම

හෝ

4.3 පිරිවෙන් අවසාන විභාගය සමත් වී තිබීම

හෝ

4.4 අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය බුද්ධාගම විෂයට සම්මාන සහිතව විෂයන් හයකින් සමත් වීම හෝ බුද්ධාගම විෂයට සම්මාන සහිතව ජ්‍යෝෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගය හෝ ජාතික පොදු අධ්‍යයන සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගය සමත් වී තිබීම.

*සටහන* :- මෙම විභාගය සඳහා ඉදිරිපත් වන සෑම අයදුම්කරුවෙකුම ඉහත 4 වැනි ඡේදයේ දක්වා ඇති සුදුසුකම් සපුරා ඇති බවට දහම් පාසල් ප්‍රධානාචාර්යවරයා විසින් සහතික කළ යුතුය.

05. අයදුම් කිරීම :-

5.1 කවර හෝ අයදුම්කරුවෙකුට බාහිර අයදුම්කරුවෙකු වශයෙන් විභාගයට පෙනී සිටීමට ඉඩ දෙනු නොලැබේ. එසේ වුවත් 4 වැනි ඡේදයේ සුදුසුකම් සපුරා ඇති යම් විභාග අපේක්ෂකයෙකු වේ නම් තමන් පදිංචි ස්ථානයට ආසන්න දහම් පාසල මඟින් රුපියල් 200ක විභාග ගාස්තුවක් ගෙවා විභාගයට පෙනී සිටීමට ඉල්ලුම් කළ හැකිය. මේ සඳහා අවශ්‍ය උපදෙස් සියළුම දහම් පාසල් ප්‍රධානීන් වෙත ලබා දෙනු ඇත.

5.2 අදාළ දහම් පාසල් ප්‍රධානීන් විසින්ම ඉදිරිපත් කළ යුතු මෙම අයදුම්පත් තැපැල් මඟින් මේ වන විට දහම් පාසල් වෙත යොමු කර ඇත.

5.3 අදාළ අයදුම්පත් භාරගන්නා අවසන් දිනය **2024.06.04** වේ.

5.4 අයදුම්පත්වල අපේක්ෂකයන්ගේ නම් ඇතුළත් කිරීමේදී

උප්පැන්න සහතිකයේ සඳහන් ආකාරයටම විය යුතු අතර ප්‍රතිඵල ලබා දීමෙන් පසුව නාම සංශෝධන සඳහා කරන ඉල්ලීම්වලදී මුද්‍රණ දෝෂ හැරුණු විට වෙනත් ඉල්ලීම් සම්බන්ධව සලකා බලනු නොලැබේ. අයදුම්පත් පැහැදිලිව ද නිවැරදිවද සම්පූර්ණ කළ යුතුය. එසේ නොවන අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

5.5 දහම් පාසලේ පරිගණක අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ යුතු අතර දහම් පාසලේ ලිපිනය වෙනස් වී නම් එය දන්විය යුතු අතර දහම් පාසලේ ප්‍රධානාචාර්යවරයා සම්බන්ධ කර ගත හැකි දුරකථන අංකය ද සඳහන් කරන්න.

5.6 අයදුම්කරුවන්ගේ අදාළ සහතික පිළිබඳවත්, සුදුසුකම් ලබා තිබීම පිළිබඳවත්, අයදුම්පත් සහතික කරන ප්‍රධානාචාර්යවරයා හෝ විද්‍යාලාධිපතිවරයා විසින් සහතික කළ යුතු හෝ වගකිව යුතුය.

06. *විභාග ගාස්තු* :- මෙම විභාගය සඳහා නියමිත විභාග ගාස්තුව රු.200 කි. එහෙත් ප්‍රථම වතාවට ඉදිරිපත් වන අයදුම්කරුවන් මෙම විභාග ගාස්තුවෙන් නිදහස් කරනු ලැබේ. ඌන සාමර්ථ්‍යය සම්පූර්ණ කිරීමට අයදුම් කරන විෂයය සඳහා විභාග ගාස්තු රු.50 කි.

6.1 අදාළ විදුහලේ විදුහල්පති විසින් විභාග ගාස්තු ගෙවීමට නියමිත සියලුම අයදුම්කරුවන්ගෙන් විභාග ගාස්තු එකතු කොට ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ ආදායම් ශීර්ෂ අංක 20-03-02-13 බැහැරවන සේ දිවයිනේ පිහිටි ඕනෑම තැපැල් කාර්යාලයකට මුදල් ගෙවා එක් ලදුපතක් ලබාගෙන එම ලදුපත ඉල්ලුම් පත්‍රයට අමුණා එවිය යුතුය. ලදුපතෙහි ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත) කුමන කරුණක් නිසාවත් මෙම විභාගය සඳහා ගෙවන ගාස්තු වෙනත් විභාගයකට මාරු කිරීම හෝ ආපසු ගෙවීමක් හෝ සිදු කරනු නොලැබේ.

07. *ප්‍රවේශ පත්‍ර* :- විභාගයට ඇතුළත් කර ගන්නා සෑම අයදුම්කරුවෙකු වෙතම, විභාග කොමසාරිස් ජනරාල් විසින් ප්‍රවේශ පත්‍රයක්, අයදුම්පත් ඉදිරිපත් කළ දහම් පාසලේ ප්‍රධානාචාර්යවරයා වෙත නිකුත් කරනු ඇත.

7.1 විභාගයට පෙනී සිටින සෑම අයදුම්කරුවෙකු විසින් ම ස්වකීය ප්‍රවේශ පත්‍රයේ තම අත්සන සහතික කරවා ගෙන විභාගයට පෙනී සිටින ප්‍රථම අවස්ථාවේදී ම විභාග ශාලාධිපති වෙත භාර දිය යුතුය. යම් අයදුම්කරුවෙකු තම ප්‍රවේශපත්‍රය භාර නොදී සිටී නම් හා විභාග කොමසාරිස් ජනරාල් විසින් තමාට නියම කරන විභාග මධ්‍යස්ථානය හැර වෙනත් විභාග මධ්‍යස්ථානයකදී විභාගයට පෙනී සිටී නම් ඔහුගේ හෝ ඇයගේ හෝ විභාග අපේක්ෂකත්වය අහෝසි කරනු ඇත.

7.2 ප්‍රවේශ පත්‍රයේ අයදුම්කරුගේ අත්සන, දහම් පාසලේ ප්‍රධානාචාර්යවරයා, පරිවෙනාධිපතිවරයා හෝ විද්‍යාලාධිපතිවරයා විසින් සහතික කළ යුතුය.

7.3 විභාගය පැවැත්වීමට දින 07කට පෙර ප්‍රවේශ පත්‍ර නොලැබුණහොත් එම දහම් පාසලේ ප්‍රධානියා විසින් ඒ බව නොපමාව විභාග කොමසාරිස් ජනරාල් වෙත දැන්විය යුතුය. එවැනි සෑම අවස්ථාවකම පහත සඳහන් විස්තර සැපයිය යුතුය.

1. විභාගයේ නම :-
2. දහම් පාසලේ නම :-
3. දහම් පාසලට ලබා දී ඇති පරිගණක අංකය :-
4. අයදුම්කරුගේ සම්පූර්ණ නම සහ ලිපිනය :-
5. ඉල්ලුම් කළ විභාග මධ්‍යස්ථානය / නගරය :-

08. *අනන්‍යතාව* :- විභාග අපේක්ෂක/අපේක්ෂිකාවන් විභාග ශාලාව තුළදී තමන් පෙනී සිටින සෑම විෂයයක් සඳහාම ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාවය සනාථ කළ යුතුය.

ඒ සඳහා පහත දක්වෙන කවර ලියවිල්ලක් හෝ භාරගනු ලැබේ.

8.1 ජාතික හැඳුනුම්පත ;
8.2 වලංගු විදේශ ගමන් බලපත්‍රය ;
8.3 වලංගු රියදුරු බලපත්‍රය ;

එමෙන්ම විභාග අපේක්ෂකයින් අනන්‍යතාව තහවුරු කර ගත හැකි වන පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතුය. එසේ තම අනන්‍යතාව සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තව ද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් විභාග බලධාරීන්ට අයදුම්කරු හඳුනා ගත හැකි පරිදි මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතුය.

09. *සමත් බව තීරණය කිරීම හා ප්‍රතිඵල නිකුත් කිරීම* :- මෙම විභාගය සඳහා නියමිත විෂය ගණන පහක් වන අතර විභාගයෙන් සාමර්ථ්‍යය ලැබීම සඳහා සෑම විභාග අපේක්ෂකයෙකුම එම විෂයයන් පහම සමත් විය යුතුය. කෙසේ වෙතත් එක් වතාවක දී අදාළ විෂයය පහෙන් එක් විෂයයක් පමණක් අසමත් නම් එය ඌන සාමාර්ථ්‍යක් ලෙස සලකනු ලැබේ. විභාගයට පෙනී සිටි වර්ෂයේ සිට අනුගාමී ඉදිරි වර්ෂ තුන (03) ඇතුළත දී එම ඌන සාමාර්ථ්‍ය ලැබූ විෂයය සඳහා නැවත පෙනී සිට එය සමත් වී ඌන සාමාර්ථ්‍ය සම්පූර්ණ කළ යුතුය. ඌන සාමර්ථ්‍යය ලබන සිසුන් ඌන සාමාර්ථ්‍ය සම්පූර්ණ කිරීමේදී විභාගයට පෙනී සිටිය යුත්තේ අනිවාර්යයෙන් ම ඌන සාමාර්ථ්‍ය ලැබූ විෂයයට පමණි.

09. සෑම විෂයයකම එක් එක් ප්‍රශ්න පත්‍රය සඳහා ලකුණු 100 ක් හිමිවන අතර, සමත්වීමේ ශ්‍රේණිවලට අදාළ ලකුණු පරාස සහ සංකේත පහත දැක්වේ. :

| ලකුණු පරාසය | ශ්‍රේණිය | සංකේතය |
|---|---|---|
| 0-34 | අසමත් | F |
| 35-54 | සමත් | S |
| 55-69 | සම්මාන | C |
| 70-100 | විශිෂ්ට සම්මාන | D |

9.2 අයදුම්කරුවන්ගේ ප්‍රතිඵල ලැයිස්තුව අදාළ දහම් පාසල් ප්‍රධානීන් වෙත තැපැල් මගින් එවනු ලැබේ.

10. *සහතික පත්‍ර*.-මෙම විභාගයෙන් සමත් වන සෑම අයදුම්කරුවකුටම විභාග දෙපාර්තමේන්තුව මගින් සහතික පත්‍රයක් නිකුත් කිරීමට විධිවිධාන යොදනු ලැබේ. අදාළ සහතික පත්‍ර ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් දහම් පාසල් ප්‍රධානාචාර්යවරුන් වෙත තැපැල් මගින් ලබා දෙනු ඇත. උක්ත විභාගය සමත්ව එහෙත් සහතික පත්‍රයක් නොලැබුණු යම් අපේක්ෂකයකු වේ නම්, ඒ පිළිබඳව දහම් පාසල් ප්‍රධානාචාර්ය මගින් විභාග කොමසාරිස් ජනරාල්, ආයතනික විභාග ප්‍රතිඵල ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැ. පෙ. 1503, කොළඹ යන ලිපිනයට ලිපියක් මගින් විමසීම් කළ යුතුය.

11. *උත්තර පත්‍ර නැවත සමීක්ෂණය* : දහම් පාසල් ප්‍රධානාචාර්යවරුන්ගේ ඉල්ලීම මත පමණක් උත්තර පත්‍ර නැවත සමීක්ෂණයට ඉඩදෙනු ලැබේ. විභාග දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරනු ලබන ආකෘති පත්‍රයකින්, විභාග ප්‍රතිඵල නිකුත් වී දින 30ක් ඇතුළත නැවත සමීක්ෂණය සඳහා ඉල්ලුම් කළ හැකිය. මේ සඳහා වන ගාස්තු වරින් වර සංශෝධනය වීමට ඉඩ ඇති බැවින් එය අදාළ අයදුම්පතෙහි දක්වනු ලැබේ. මෙම ගාස්තු ආපසු ගෙවනු ලබන්නේ මුලින්ම දෙන ලද ප්‍රතිඵලයක වෙනසක් සිදුවුවහොත් පමණි. කවර හේතුවක් නිසාවත් අයදුම්කරුවන්ට හෝ ඔවුන්ගේ නියෝජිතයන්ට හෝ උත්තර පත්‍ර පරීක්ෂා කිරීමට ඉඩදෙනු නොලැබේ.

12. *විෂය නිර්දේශය* :

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් සංවිධානය කොට පැවැත්වීමට නියමිත දහම් පාසල් අවසාන සහතික පත්‍ර විභාගයට අදාළ විෂයය නිර්දේශය උපලේඛන 02 ලෙස මෙම නිවේදනය අවසානයේ දක්වා ඇත.

13. මෙම ව්‍යවස්ථාව සහ විෂයය නිර්දේශ පත්‍රයේ දක්වා ඇති විධිවිධානවලට අනුකූලව ක්‍රියා කිරීමට සියලුම විභාග අයදුම්කරුවන් බැඳී සිටින අතර, මෙහි විධිවිධාන සලසා නැති කවර හෝ යම් කරුණක් වෙතොත් එය විභාග කොමසාරිස් ජනරාල්වරයාගේ අභිමතය පරිදි තීරණය වනු ඇත.

14. සිංහල හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැළපීමක් හෝ අනනුකූලතාවක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

එච්. ජේ. එම්. සී. අමිත් ජයසුන්දර,
විභාග කොමසාරිස් ජනරාල්.

2024 අප්‍රේල් මස 26 වැනි දින,
බත්තරමුල්ල,
පැලවත්ත,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

**උපලේඛන 02**

විභාග විෂය හා විෂය නිර්දේශය

මෙම විභාගය පැය 03 බැගින් වූ ප්‍රශ්න පත්‍ර 5කින් සමන්විත ය.

- **ථෙරවාදී බුද්ධ ධර්මයේ මූලික ඉගැන්වීම :**

චතුරාර්‍ය සත්‍යය, ත්‍රිලක්ෂණය, ඝන්ධායතන ධාතු විභාගය, පටිච්චසමුප්පාදය, ධර්ම විභාගය, කුසලාකුසල විනිශ්චය, සත්තිස් බෝධිපාක්ෂ ධර්ම, නිර්වාණය සහ නිර්වාණග ාමී මාර්ගය සහ භාවනා යන කරුණු පිළිබඳ විධිමත් ඥාණයක් අපේක්ෂිතයි. විශේෂයෙන්ම මෙම සංකල්ප ථේරවාදී සම්ප්‍රදායෙහි විවරණය කර

- **බෞද්ධ විනය මාර්ගය හා පාලි භාෂා පරිචය :**

(අ) *බෞද්ධ විනය මාර්ගය :*

i. *පැවිදි අපේක්ෂකයන් සඳහා*
බෞද්ධ භික්ෂු සමාජයේ ප්‍රභවය හා සංවර්ධනය, ගුරු ශිෂ්‍ය සම්බන්ධය, විනය නීති පැනවීමේ මූලික පරමාර්ථ, භික්ෂු ප්‍රාතිමෝක්ෂය පිළිබඳ සාමාන්‍ය අවබෝධය, උපෝසථ කර්මය, වස් විසීම, පවාරණය, කඨිණය, බෞද්ධ අධිකරණ ක්‍රම, දණ්ඩ කර්ම, පබ්බජ්ජ සහ උපසම්පදා, ගිහි පැවිදි සම්බන්ධය, බෞද්ධ සමාජ ධර්ම

ii. *ගිහි අපේක්ෂකයන් සඳහා*

සිඝාලෝවාද, වසල, ව්‍යග්ඝපජ්ජ, පරාභව, මංගල හා ධම්මික යන සූත්‍ර ඇසුරෙන් බෞද්ධ ශික්ෂණ මාර්ගය හා සමාජ ආචාර ධර්ම පිළිබඳ අවබෝධයක්

*පාලි භාෂා පරිචය :*

i. පොල්වත්තේ බුද්ධදත්ත නාහිමියන්ගේ පාලි භාෂාව තරණය -

පළමු පොත ඇසුරෙන් පාලි භාෂාව පිළිබඳ දැනුම පරීක්ෂා කෙරේ.

ii. පහත දැක්වෙන පාලි ගාථා හා පාඨ පිළිබඳ අවබෝධය සහ ධර්ම ව්‍යාඛ්‍යානය පිළිබඳ දැනුම, පරීක්ෂා කරනු ලැබේ.

**ගාථා - සූචි**

| | | |
|---|---|---|
| -3, 4.5 ගාථා | පාප වශයෙන් | -1, 4 ගාථා |
| -10 ගාථාව | දණ්ඩ වශයෙන් | -1, 2 ගාථා |
| -6, 7 ගාථා | ජරා වශයෙන් | -1, 2 ගාථා |
| - 2, 8 ගාථා | අතත වශයෙන් | -2, 4 ගාථා |
| - 5, 6 ගාථා | බුද්ධ වශයෙන් | -10 |

**ගාථා - 05**

සාලිකේදාර, සත්තිකුම්බ, කින්නිර, මහාකපි, මාතුපෝසක

**අභිධර්මය**

අභිධර්මයේ ප්‍රභවය හා සංවර්ධනය පිළිබඳ මතභේද, විවිධ අභිධර්ම සම්ප්‍රදාය, අභිධර්ම සාහිත්‍යය යන මේවා පිළිබඳ සාමාන්‍ය දැනුමක්, සතර පරමාර්ථ පිළිබඳ ලක්ෂණ කථනය, කය හා සිත පිළිබඳ බෞද්ධ විවරණය, භෞතික ලෝකය පිළිබඳ බෞද්ධ විග්‍රහය, සංඛත සහ අසංඛත ධර්ම සිතෙහි ස්වභාවය හා ක්‍රියාකාරීත්වය, සිත කිළිටි වීම හා පිරිසිදු කර ගැනීම (මේ සඳහා අභිධර්මාර්ථ සංග්‍රහය පරිශීලනය කිරීම මැනවි.)

**බෞද්ධ ඉතිහාසය හා සංස්කෘතිය**

භාරතීය බෞද්ධ නිකායයන්ගේ සම්භවය සහ ව්‍යාප්තිය, ධර්මාශෝක යුගයෙහි බෞද්ධ සංස්කෘතිය, කණිෂ්ක රාජ සමයෙහි බෞද්ධ ප්‍රබෝධය, මහායානයෙහි සම්භවය, භාරතීය බෞද්ධ විශ්වවිද්‍යාලයේ, භාරතීය බෞද්ධ පඬිවරු, බුදු සමයෙහි දේශාන්තර ව්‍යාප්තිය, ප්‍රාග් මහින්ද යුගයේ ශ්‍රී ලංකා සංස්කෘතිය, ලක් බුදු සමය කෙරෙහි රාජානුග්‍රහය, ශ්‍රී ලංකා සංස්කෘතිය බුදු සමයෙන් පෝෂණය ලත් අයුරු, ලක්දිව ශාසන ශෝධනය, බුදු පිළිමයෙහි සම්භවය හා ප්‍රතිමා ලක්ෂණ, ස්තූප සම්භවය හා විවිධ ස්තූප වර්ග, චෛතියඝර හා පටිමාඝර

**බෞද්ධ සමාජ දර්ශනය**

සමාජ සංස්ථාවන්ගේ ප්‍රභවය හා ක්‍රියාකාරීත්වය පිළිබඳ බෞද්ධ අදහස්, රාජ්‍ය රාෂ්ට්‍ර පාලනය, ආර්ථිකය හා ආර්ථික සංරක්ෂණය, ජීවී - අජීවී පරිසරය, නීතිය යුක්තිය හා දණ්ඩනය, යුද්ධය හා සාමය, ජාතිවාදය හා කුලභේදය, මානව අයිතිය ජනගහනය හා සංවර්ධනය විද්‍යාත්මක හා තාක්ෂණික ප්‍රගතිය, කාර්මීකරණය, සාමාජික සහජීවනය වැනි කරුණු පිළිබඳ බෞද්ධ අදහස්.

**බෞද්ධ ධර්මාචාර්ය විභාගය - 2024**

විභාග මධ්‍යස්ථාන පිහිටුවනු ලබන නගර ලේඛනය

| **දිස්ත්‍රික්කය — කොළඹ 01** | |
|---|---|
| *නගරය* | *නගර අංකය* |
| කොටහේන | 101 |
| මරදාන | 102 |
| බොරැල්ල | 103 |
| බම්බලපිටිය | 104 |
| මහරගම | 105 |
| ගල්කිස්ස | 106 |
| දෙහිවල | 107 |
| නුගේගොඩ | 108 |
| මොරටුව | 109 |
| පිළියන්දල | 110 |
| හෝමාගම | 111 |
| අවිස්සාවේල්ල | 112 |

| **දිස්ත්‍රික්කය — ගම්පහ 02** | |
|---|---|
| *නගරය* | *නගර අංකය* |
| ගම්පහ | 201 |
| වේයන්ගොඩ | 202 |
| මිනුවන්ගොඩ | 203 |
| මීරිගම | 204 |
| මීගමුව | 205 |
| වත්තල | 206 |
| කැලණිය | 207 |

| **දිස්ත්‍රික්කය — කළුතර 03** | |
|---|---|
| *නගරය* | *නගර අංකය* |
| කළුතර | 301 |
| පානදුර | 302 |
| අළුත්ගම | 303 |
| හොරණ | 304 |
| මතුගම | 305 |
| මීගහතැන්න | 306 |

| **දිස්ත්‍රික්කය — මාතලේ 04** | |
|---|---|
| *නගරය* | *නගර අංකය* |
| මාතලේ | 401 |
| ගලේවෙල | 402 |
| දඹුල්ල | 403 |
| නාඋල | 404 |
| ලග්ගල | 405 |
| විල්ගමුව | 406 |

| **දිස්ත්‍රික්කය — මහනුවර 05** | |
|---|---|
| *නගරය* | *නගර අංකය* |
| මහනුවර | 501 |
| කටුගස්තොට | 502 |
| නුගවෙල | 503 |
| තෙල්දෙනිය | 504 |
| මැද මහනුවර | 505 |
| වත්තේගම | 506 |
| ගලහ | 507 |
| ගලගෙදර | 508 |
| ගම්පොළ | 509 |
| නාවලපිටිය | 510 |
| පිළිමතලාව | 511 |

| **දිස්ත්‍රික්කය — නුවරඑළිය 06** | |
|---|---|
| *නගරය* | *නගර අංකය* |
| නුවරඑළිය | 601 |
| හැඳුනුවැව | 602 |
| හැටන් | 603 |
| ගිනිගත්හේන | 604 |
| හඟුරන්කෙත | 605 |
| වලපනේ | 606 |

| **දිස්ත්‍රික්කය — ගාල්ල 07** | |
|---|---|
| *නගරය* | *නගර අංකය* |
| ගාල්ල | 701 |
| අම්බලන්ගොඩ | 702 |
| බලපිටිය | 703 |
| ඇල්පිටිය | 704 |
| බද්දේගම | 705 |
| උඩුගම | 706 |
| අහංගම | 707 |

| **දිස්ත්‍රික්කය — මාතර 08** | |
|---|---|
| *නගරය* | *නගර අංකය* |
| මාතර | 801 |
| වැලිගම | 802 |
| කඹුරුපිටිය | 803 |
| හක්මන | 804 |
| දික්වැල්ල | 805 |
| අකුරැස්ස | 806 |
| දෙනියාය | 807 |
| කොටපොල | 808 |

| **දිස්ත්‍රික්කය — හම්බන්තොට 09** | |
|---|---|
| *නගරය* | *නගර අංකය* |
| හම්බන්තොට | 901 |
| වලස්මුල්ල | 902 |
| වීරකැටිය | 903 |
| තංගල්ල | 904 |
| අම්බලන්තොට | 905 |
| බෙලිඅත්ත | 906 |
| තිස්සමහාරාමය | 907 |
| අගුණකොළපැලැස්ස | 908 |

| **දිස්ත්‍රික්කය — වව්නියාව 10** | |
|---|---|
| *නගරය* | *නගර අංකය* |
| වව්නියාව | 1001 |

| **දිස්ත්‍රික්කය — ත්‍රිකුණාමලය 11** | |
|---|---|
| *නගරය* | *නගර අංකය* |
| ත්‍රිකුණාමලය | 1101 |
| කන්තලේ | 1102 |

| **දිස්ත්‍රික්කය — අම්පාර 12** | |
|---|---|
| *නගරය* | *නගර අංකය* |
| අම්පාර | 1201 |
| සේරංකඩ | 1202 |
| මහඔය | 1203 |
| දෙහිඅත්තකණ්ඩිය | 1204 |

| දිස්ත්‍රික්කය — පුත්තලම 13 | |
|---|---|
| *නගරය* | *නගර අංකය* |
| පුත්තලම | 1301 |
| ආණමඩුව | 1302 |
| හලාවත | 1303 |
| වෙන්නප්පුව | 1304 |

| දිස්ත්‍රික්කය — කුරුණෑගල 14 | |
|---|---|
| *නගරය* | *නගර අංකය* |
| කුරුණෑගල | 1401 |
| පොල්ගහවෙල | 1402 |
| ඉබ්බාගමුව | 1403 |
| මැල්සිරිපුර | 1404 |
| කුලියාපිටිය | 1405 |
| හෙට්ටිපොල | 1406 |
| නිකවැරටිය | 1407 |
| මහව | 1408 |
| ගල්ගමුව | 1409 |
| ගිරිඋල්ල | 1410 |

| දිස්ත්‍රික්කය — අනුරාධපුර 15 | |
|---|---|
| *නගරය* | *නගර අංකය* |
| අනුරාධපුරය | 1501 |
| මැදවච්චිය | 1502 |
| කැකිරාව | 1503 |
| පදවිය | 1504 |
| ගලෙන්බිඳුනුවැව | 1505 |
| තඹුත්තේගම | 1506 |
| හොරොව්පතාන | 1507 |
| නොච්චියාගම | 1508 |

| දිස්ත්‍රික්කය — පොළොන්නරුව 16 | |
|---|---|
| *නගරය* | *නගර අංකය* |
| පොළොන්නරුව | 1601 |
| මනම්පිටිය | 1602 |
| හිඟුරක්ගොඩ | 1603 |
| මැදිරිගිරිය | 1604 |

| දිස්ත්‍රික්කය — බදුල්ල 17 | |
|---|---|
| *නගරය* | *නගර අංකය* |
| බදුල්ල | 1701 |
| වැලිමඩ | 1702 |
| බණ්ඩාරවෙල | 1703 |
| පස්සර | 1704 |
| මහියංගනය | 1705 |
| ගිරාදුරුකෝට්ටේ | 1706 |
| මීගහකිවුල | 1707 |

| දිස්ත්‍රික්කය — මොණරාගල 18 | |
|---|---|
| *නගරය* | *නගර අංකය* |
| මොණරාගල | 1801 |
| බිබිල | 1802 |
| වැල්ලවාය | 1803 |
| කතරගම | 1804 |
| දොඹගහවෙල | 1805 |

| දිස්ත්‍රික්කය — කෑගල්ල 19 | |
|---|---|
| *නගරය* | *නගර අංකය* |
| කෑගල්ල | 1901 |
| අරණායක | 1902 |
| රඹුක්කන | 1903 |
| මාවනැල්ල | 1904 |
| රුවන්වැල්ල | 1905 |
| යටියන්තොට | 1906 |
| වරකාපොළ | 1907 |

| දිස්ත්‍රික්කය — රත්නපුරය 20 | |
|---|---|
| *නගරය* | *නගර අංකය* |
| රත්නපුරය<br>ඇහැලියගොඩ | 2001<br>2002 |
| පැල්මඩුල්ල | 2003 |
| බලංගොඩ | 2004 |
| ඇඹිලිපිටිය | 2005 |
| රක්වාන | 2006 |
| කලවාන | 2007 |

## ජනමාධ්‍ය අමාත්‍යාංශය

### රැකියා සුලභ මුද්‍රණ සහ ග්‍රැෆික්ස් ක්ෂේත්‍රයට පිවිසෙන්න

# ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය

ISO තත්ත්ව සහතිකයෙන් පිදුම්ලත් ආයතනයකි

### ග්‍රැෆික්ස්, මල්ටිමීඩියා සහ මුද්‍රණ පාඨමාලා - 2024 වර්ෂය

ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයේ පාඨමාලා හදාරා මුද්‍රණ, ග්‍රැෆික්ස් සහ මල්ටිමීඩියා ක්ෂේත්‍රයේ නිපුණයෙකු වන්න.

### පාසල් හැරගිය සිසුන් සඳහා ඕෆ්සෙට් ලිතෝ මුද්‍රණකරණය පිළිබඳ පූර්ණකාලීන NVQ පාඨමාලාව
### NVQ Training Programme in Offset Lithopress Operation for School Leaves (Full time)

අද දිවයිනේ ඉහළ රැකියා ඉල්ලුමක්ව පවතින ඕෆ්සෙට් මුද්‍රණ යන්ත්‍ර ක්‍රියාකරුවන් පුහුණු කිරීමේ පූර්ණකාලීන පාඨමාලාවක් වන මෙම පුහුණු වැඩසටහන තුළින් ඕෆ්සෙට් ලිතෝකරණය (Offset Lithography) Sheet Fed සහ Stream Feeder ලිතෝ මුද්‍රණ යන්ත්‍ර ක්‍රියාකරවීම ඇතුළු ඕෆ්සෙට් මුද්‍රණකරණයට අදාළ ප්‍රායෝගික හා න්‍යායාත්මක දැනුම හා පුහුණුව ලබාදේ. පුහුණුව අවසාන කිරීමෙන් පසු ඔවුන් රැකියා සඳහා අනුයුක්ත කෙරේ.

මාධ්‍යය : සිංහල පාඨමාලා ගාස්තුව : රු. 30,000

---

#### මයික්‍රොසොෆ්ට් ඔෆිස් - Microsoft Office

මෙම පාඨමාලාව තුළින් MS Office පිළිබඳ පූර්ණ අවබෝධයක් සහ පුහුණුවක් ලබා දෙන අතර, පරිගණක භාවිතය පිළිබඳව ද මූලික දැනුම හා අවබෝධය ද ලබා දේ. මෙම පාඨමාලාව පාසල් හැරගිය නවකයන්ට මෙන්ම ආයතනවල රැකියාවන්හි නියුතු පුද්ගලයන්ට ද MS Office පිළිබඳව පූර්ණ දැනුම හා අවබෝධය ලබා දේ.

පාඨමාලා කාලය : මාස 05 යි (අර්ධකාලීන) මාධ්‍යය : සිංහල සහ ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුව : රු. 22,000

---

#### පරිගණක ආශ්‍රිත ග්‍රැෆික් නිර්මාණකරණය - Computer Graphic Design

ග්‍රැෆික්, මුද්‍රණ හා මල්ටිමීඩියා ක්ෂේත්‍රයේ පවතින ඉහළ රැකියා ඉල්ලුමට සරිලන ලෙස මෙම පාඨමාලාව සකස් කර ඇති අතර, ඒ තුළින් අද ග්‍රැෆික් නිර්මාණයට අවශ්‍ය සියලු මෘදුකාංග පිළිබඳ පුළුල් පුහුණුවක් ලබා දෙයි. මෙම පාඨමාලාව පාසල් හැරගිය සිසුන්ට හා ග්‍රැෆික් ක්ෂේත්‍රයේ නියැළෙන පුද්ගලයන්ට මනා දැනුම ද, පුහුණුව ද ලබා දේ.

පාඨමාලා කාලය : මාස 06 (අර්ධකාලීන) මාධ්‍යය : සිංහල/ඉංග්‍රීසි

පාඨමාලා ගාස්තුව : ආයතනික සහතිකපත් පාඨමාලාව රු. 25,000 NVQ සහතිකපත් පාඨමාලාව රු. 45,000

---

#### පරිගණක ආශ්‍රිත අකුරු ඇමිණීම සහ පිටු සැකසීම - Computer Typesetting and Desktop Publishing

මෙම පාඨමාලාවට ඉතා ඉහළ ඉල්ලුමක් පවතින අතර මුද්‍රණ, ග්‍රැෆික්ස්, ප්‍රචාරක හා ප්‍රකාශන ක්ෂේත්‍රයේ පවතින ඉහළ රැකියා ඉල්ලුමට සරිලන පාඨමාලා අන්තර්ගතයකින් සකස්වන අතර ග්‍රැෆික්, ප්‍රචාරක, මුද්‍රණ සහ ප්‍රකාශන ක්ෂේත්‍රයන්ට ඇතුළත් වීමට බලාපොරොත්තුවන නවකයින් සඳහා විශේෂයෙන් සැකසුණු පාඨමාලාවකි.

පාඨමාලා කාලය : මාස 06 යි (අර්ධකාලීන) මාධ්‍යය : සිංහල/ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුව : රු. 22,000

---

#### වෙබ් අඩවි නිර්මාණය - Web Designing

මෙම පාඨමාලාව තුළින් වෙබ් අඩවි නිර්මාණය පිළිබඳ නවීන තාක්ෂණයට අනුකූලව පුළුල් අවබෝධයක් සහ පුහුණුවක් ලබා දේ. පරිගණක ක්ෂේත්‍රයේ නියැළි පුද්ගලයන්ට හා මෙම ක්ෂේත්‍රයට ඇතුළත් වීමට අදහස් කරන නවකයන්ට ද මෙම පාඨමාලාව ඉමහත් ප්‍රයෝජනවත් වේ.

පාඨමාලා කාලය : මාස 05 යි (අර්ධකාලීන) මාධ්‍යය : සිංහල/ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුව : රු. 25,000

---

#### පොත් බැඳීම හා නිමාකරණය - Book Binding & Finishing
#### පොත් බැඳීම - Book Binding - NVQ 4

මෙම පාඨමාලාවට ඉතා ඉහළ ඉල්ලුමක් ඇත. මේ තුළින් පොත් බැඳීම, නිමාව පිළිබඳ පුළුල් අවබෝධයක්, න්‍යායාත්මක හා ප්‍රායෝගික පුහුණුව මේ තුළින් ලබාදේ. මෙම පාඨමාලාව පාසල් හැරගිය සිසුන්ට මෙන්ම ක්ෂේත්‍රයේ නියැළි පුද්ගලයන්ට ද මහත් ප්‍රයෝජනයකි.

පාඨමාලා කාලය : මාස 06 - මාස 08 | මාධ්‍යය : සිංහල | පාඨමාලා ගාස්තුව : රු. 40,000
NVQ පාඨමාලාව : රු. 65,000

**අරේඛීය සංස්කරණය - Non Linear Editing**

මෙම පාඨමාලාව තුළින් රූපවාහිනී වැඩසටහන් සංස්කරණය සහ පිටපත් රචනය පිළිබඳ පූර්ණ ප්‍රායෝගික සහ න්‍යායාත්මක අවබෝධය ලබාදේ. පාසල් හැරගිය සිසුන්ට ද වීඩියෝ, රූපවාහිනී, චලන රූප කර්මාන්තයේ සහ ඉලෙක්ට්‍රොනික් සන්නිවේදන හා චිත්‍රපට කර්මාන්තයේ නිරතවූවන් හට ද මෙම පාඨමාලාව ඉමහත් ප්‍රයෝජනවත් වේ.

පාඨමාලා කාලය : මාස 06 (අර්ධකාලීන) | මාධ්‍යය : සිංහල/ ඉංග්‍රීසි | පාඨමාලා ගාස්තුව : රු. 40,000

**ත්‍රිමාණ සජීවීකරණය - Digital Animation**

මෙම පාඨමාලාව තුළින් පරිගණක ආධාරයෙන් ද්විමාන සහ ත්‍රිමාණ චලන රූප නිර්මාණකරණය කිරීම සහ එම රූප, රූපවාහිනී සහ චිත්‍රපට මාධ්‍ය සඳහා යොදා ගන්නා අයුරු සවිස්තරාත්මකව පුහුණු කෙරේ.

පාඨමාලා කාලය : මාස 06 (අර්ධකාලීන) | මාධ්‍යය : සිංහල සහ ඉංග්‍රීසි | පාඨමාලා ගාස්තුව : රු. 40,000

**පරිගණක දෘඩාංග එකලස් කිරීම සහ සැකසීම - Computer Hardware & PC Assembly**

මෙම පාඨමාලාව තුළින් පරිගණක දෘඩාංග/මෘදුකාංග සහ පරිගණක එකලස් කිරීම පිළිබඳව මනා දැනුමක් සහ අවබෝධයක් ලබා දෙන අතර, එදිනෙදා පැන නගින දෘඩාංග/මෘදුකාංගවලට අදාළ තාක්ෂණික හා ප්‍රායෝගික ගැටළු විසඳා ගැනීමට මහත් සේ මෙම පාඨමාලාව ප්‍රයෝජනවත් වේ. නවකයන්ට මෙන් ම පරිගණක තාක්ෂණයේ නියැළි පුද්ගලයන්ට ද මෙම පාඨමාලාව එකසේ ප්‍රයෝජනවත් වනු ඇත.

පාඨමාලා කාලය : මාස 04 යි (අර්ධකාලීන) | මාධ්‍යය : සිංහල/ ඉංග්‍රීසි | පාඨමාලා ගාස්තුව : රු.25,000

**ඕෆ්සෙට් ලිතෝකරණය - Offset Lithography**

මෙම පාඨමාලාව තුළින් අද ප්‍රචලිතව පවතින ඕෆ්සෙට් මුද්‍රණ තාක්ෂණය සහ ඕෆ්සෙට් මුද්‍රණ යන්ත්‍ර ක්‍රියාකරණය පිළිබඳව පූර්ණ අවබෝධයක් සහ දැනුමක් ලබා දේ. ඕෆ්සෙට් මුද්‍රණ ක්ෂේත්‍රයේ නියැළි පුද්ගලයන්ට මෙන් ම එම ක්ෂේත්‍රයට ඇතුළත්වීමට අදහස් කරන නවකයන්ට ද මෙම පාඨමාලාව මහත් ප්‍රයෝජනවත් වේ.

පාඨමාලා කාලය : වසර 01 යි (අර්ධකාලීන) | මාධ්‍යය : සිංහල/ඉංග්‍රීසි | පාඨමාලා ගාස්තුව : රු. 35,000

**නවීන වර්ණ 4 මුද්‍රණ යන්ත්‍ර ක්‍රියාකරණය පිළිබඳ පුහුණු පාඨමාලාව**
**Modern Four Colour Offset Printing Machine Operation**

මෙම පාඨමාලාවේ අරමුණ වනුයේ නවීනතම සිව් වර්ණ ඕෆ්සෙට් මුද්‍රණ යන්ත්‍ර පිළිබඳ පුළුල් වපසරියක පුහුණුවක් ලබා දී ඒ තුළින් යන්ත්‍ර ස්වාධීනව ක්‍රියාකරවීමට සහ තත්ත්වයෙන් උසස් ගුණාත්මක ප්‍රතිඵල ලබාගැනීම සඳහා සහභාගිවන්නවුන් පුහුණු කිරීමය. සියලුම පුහුණුකරුවන්ට නවීනතම Heidelberg Speed Master Offset මුද්‍රණ යන්ත්‍රයක පුහුණුව ලබා දේ. විදෙස්ගත රැකියා සඳහා යොමුවන මුද්‍රණකරුවන්ට මෙම පාඨමාලාව මහත් ඵලදායී පුහුණුවක් ලබා දේ.

පාඨමාලා කාලය : මාස 03යි (අර්ධකාලීන) | මාධ්‍යය : සිංහල | පාඨමාලා ගාස්තුව : රු. 35,000

**ඩිජිටල් මුද්‍රණ තාක්ෂණය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව - Certificate Course on Digital Printing Technology**

මෙම පාඨමාලාවේ පරමාර්ථය වනුයේ නවීනතම මුද්‍රණ තාක්ෂණය වන ඩිජිටල් මුද්‍රණ තාක්ෂණය පිළිබඳ පූර්ණ න්‍යායාත්මක සහ ප්‍රායෝගික දැනුම ලබා දී ඒ තුළින් එම ක්ෂේත්‍රයට පිවිසීමට අවශ්‍ය පුළුල් තාක්ෂණික/ප්‍රායෝගික පුහුණුව සහ අවබෝධය ලබා දීමය.

පාඨමාලා කාලය : මාස 04 යි (අර්ධකාලීන) | මාධ්‍යය : සිංහල/ඉංග්‍රීසි | පාඨමාලා ගාස්තුව : රු. 25,000

**ග්‍රැෆික් ඩිසයින් පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව - Diploma in Graphic Design**

මෙම පාඨමාලාව මගින් ග්‍රැෆික් නිර්මාණකරණය, කළමනාකරණය සහ මෘදුකාංග ඇතුළුව නිර්මාණ සංකල්ප සහ යෙදීම් පිළිබඳ උසස් මට්ටමේ ප්‍රායෝගික සහ න්‍යායාත්මක පුහුණුවක් ලබා දේ. ග්‍රැෆික්ස් නිර්මාණකරණයට අදාළ මෘදුකාංග භාවිතයෙන් සාර්ථක නිර්මාණ බිහි කිරීමේ නිපුණතාවයන් වර්ධනය වන අයුරින් මෙහි විෂය මාලාව සකස්කර ඇති අතර, මෙම පාඨමාලාව හැදෑරීමෙන් ඔබට පරිපූර්ණ ග්‍රැෆික්ස් නිර්මාණකරුවෙකු විය හැක.

කාලය : වසර 01යි (අර්ධකාලීන) මාධ්‍යය : සිංහල පාඨමාලා ගාස්තුව : රු. 70,000

---

**වෙබ් අඩවි නිර්මාණය - Certificate Course in Web Design**

මෙම පාඨමාලාව තුළින් වෙබ් අඩවි නිර්මාණකරණය පිළිබඳ නවීන තාක්ෂණයට අනුකූලව වෙබ් අඩවියක් නිර්මාණය කිරීම සඳහා අවශ්‍ය පුළුල් දැනුමක් සහ ප්‍රායෝගික පුහුණුවක් ලබා දේ. මෙම පාඨමාලාව නවකයන්ට ද මාධ්‍ය ක්ෂේත්‍රයේ සේවය කරන සියලු දෙනාටම ඉමහත් ප්‍රයෝජනවත් පාඨමාලාවකි.

පාඨමාලා කාලය : මාස 05 (අර්ධකාලීන) මාධ්‍ය : සිංහල පාඨමාලා ගාස්තුව : රු. 25,000

---

**ඩිජිටල් පෙර මුද්‍රණය - Certificate Course in Digital Pre Press**

මෙම පාඨමාලාව තුළින් පෙර මුද්‍රණ තාක්ෂණයට අදාළ මෘදුකාංග සහ අනෙකුත් මුද්‍රණ තාක්ෂණයට අදාළ ඩිජිටල් ක්‍රියාවලියන් පිළිබඳ පූර්ණ අවබෝධයක් සහ ප්‍රායෝගික පුහුණුවක් ලබා දේ.

පාඨමාලා කාලය : වසර 01යි (අර්ධකාලීන) මාධ්‍ය : සිංහල පාඨමාලා ගාස්තුව : රු. 35,000

---

**පිරිවැය හා ඇස්තමේන්තුකරණය - Certificate Course in Costing & Estimating**

මෙම පාඨමාලාව තුළින් මුද්‍රණ ක්ෂේත්‍රයේ පිරිවැයකරණය සමග ඇස්තමේන්තුකරණය පිළිබඳ පූර්ණ දැනුමක් සහ අවබෝධයක් ලබාදේ. මුද්‍රණ ක්ෂේත්‍රයේ නියැලි පුද්ගලයන්ට ද එම ක්ෂේත්‍රයට ඇතුළත් වන නවකයන්ට ද ඉමහත් ප්‍රයෝජනවත් පාඨමාලාවකි.

පාඨමාලා කාලය : වසර 01 යි (අර්ධකාලීන) මාධ්‍ය : සිංහල පාඨමාලා ගාස්තුව : රු. 35,000

**ඩිජිටල් මුද්‍රණ තාක්ෂණය හා සිව් වර්ණ ඕෆ්සෙට් මුද්‍රණ තාක්ෂණය පිළිබඳ ද්විත්ව පුහුණු පාඨමාලාව**

**Training Programme in Digital Printing Technology and Multi Colour Offset Printing Technology**

මෙම පාඨමාලාව තුළින් නවතම ඩිජිටල් මුද්‍රණ තාක්ෂණය සහ සිව් වර්ණ ඕෆ්සෙට් මුද්‍රණ තාක්ෂණය පිළිබඳ නවීනතම යන්ත්‍ර ආශ්‍රයෙන් පුහුණු කරනු ලැබේ. විදේශ රැකියා අපේක්ෂිත තරුණයන් සඳහාම මෙම පාඨමාලාව විශේෂයෙන්ම සැකසී ඇත.

සීමිත සිසුන් සංඛ්‍යාවක් පමණක් මෙම පුහුණු පාඨමාලාව සඳහා බඳවා ගනු ලැබේ.

පාඨමාලා කාලය : මාස 04 යි (අර්ධකාලීන) මාධ්‍ය : සිංහල පාඨමාලා ගාස්තුව : රු. 40,000

ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයේ පාඨමාලා සියල්ල උසස් ප්‍රමිතියකට අනුව ක්ෂේත්‍රයේ රැකියාවලට ගැළපෙන අයුරින් සකස්කොට ඇති අතර, පාඨමාලා සාර්ථකව නිමකරන සිසුන්හට රජය හා ජාත්‍යන්තරව පිළිගත් වටිනා සහතික පත්‍රයක් ප්‍රදානය කෙරේ.

**පාඨමාලා අධ්‍යක්ෂ, ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය,**
**ජනමාධ්‍ය අමාත්‍යාංශය,**
**රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,**
**අංක 118, දොස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත, කොළඹ 08.**

**දුරකතන : 011 2686162, 011 2679791, 071 9716655, 077 7706995**
**ෆැක්ස් : 011 2686162**
**ඊ-මේල් : sliopdir@sltnet.lk**
**වෙබ් අඩවිය : www.sliop.edu.lk**

**ශාඛා : ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය, මාතලේ ශාඛාව,**
**දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මාතලේ.**
**දුරකතන අංක : 066 2222172, 071 0554298.**

05-000

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙන සියලුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවා මෙන් ම එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය මිල දී ගැනීම සඳහා සියලුම දායක මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

**සැළකිය යුතුයි.** - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | | | **2024 වර්ෂය** | | | |
| මැයි | 2024.05.03 | සිකුරාදා | 2024.04.19 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2024.05.10 | සිකුරාදා | 2024.04.26 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2024.05.17 | සිකුරාදා | 2024.05.03 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2024.05.22 | බදාදා | 2024.05.10 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2024.05.31 | සිකුරාදා | 2024.05.17 | සිකුරාදා | දහවල් | 12.00 |
| ජුනි | 2024.06.07 | සිකුරාදා | 2024.05.22 | බදාදා | දහවල් | 12.00 |
| | 2024.06.14 | සිකුරාදා | 2024.05.31 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2024.06.20 | බ්‍රහස්පතින්දා | 2024.06.07 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2024.06.28 | සිකුරාදා | 2024.06.14 | සිකුරාදා | දහවල් | 12.00 |
| ජූලි | 2024.07.05 | සිකුරාදා | 2024.06.20 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |
| | 2024.07.12 | සිකුරාදා | 2024.06.28 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2024.07.19 | සිකුරාදා | 2024.07.05 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2024.07.26 | සිකුරාදා | 2024.07.12 | සිකුරාදා | දහවල් | 12.00 |

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2024 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.